| ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය | | |
|---|---|---|
| දෙවන වාර පරීක්ෂණය - 2018 | | |
| 09 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව **I - II** | කාලය පැය 02 |

**සැලකිය යුතුයි. :**

**I. පත්‍රයේ පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.**

**II. පත්‍රයට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු පත්‍රයේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.**

- **අංක 01 සිට 05 දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ලෝකයේ භූමි ප්‍රමාණයෙන් වැඩිම මහද්වීපය වන්නේ,
   I. ඕස්ට්‍රේලියාවයි. II. උතුරු ඇමෙරිකාවයි. III. ආසියාවයි. IV. අප්‍රිකාවයි.
2. කහ ගඟ යන අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලබන්නේ,
   I. හොවැංහෝ ගඟ යි. II. නයිල් යි.
   III. මහවැලි යි. IV. ඉරවැඩි ගඟ යි.
3. ලෝකයේ ජනාධිකම රට වන්නේ,
   I. ඉන්දියාවයි. II. ඕස්ට්‍රේලියාවයි.
   III. චීනයයි. IV. මාල දිවයිනයි.
4. මෝටර් රථ නිෂ්පාදනයේ ප්‍රමුඛයා වන්නේ
   I. ඇමෙරිකා එක්සත් ජනපදයයි. II. ඉන්දියාවයි.
   III. ජපානයයි. IV. ජර්මනියයි.
5. උස්බිම් අතර පිහිටි දිගැටි හැඩයෙන් යුත් පහත් බිම,
   I. නිම්නයයි. II. නෙරුවයි. III. තුඩුවයි. IV. තැනිතලාවයි.

- **අංක 06 - 10 දක්වා ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි (✗) ලකුණ ද යොදන්න.**

6. ටිබෙට් සානුව "ලෝකයේ පියස්ස" යනුවෙන් හැඳින්වේ. (    )
7. ලෝකයේ දේශගුණික කලාප තුනටම අයත්වන මහාද්වීපය වනුයේ ආසියාවය. (    )
8. ලංකාව භූ විෂමතා කලාප 4කට බෙදා දක්වයි. (    )
9. ලංකාවේ ජන සංඛ්‍යාවෙන් 1/4ක් උතුරු මැද පළාත තුළ ඒකරාශී වී ඇත. (    )
10. සාගරය දෙසට නෙරා ගිය පටු ගොඩබිම් කොටස් තුඩු නමින් හැඳින්වේ. (    )

- **අංක 11 - 15 දක්වා වගන්තිවලට සුදුසු වචනය වරහන් තුළින් තෝරා නිමින් හිස් තැන මත ලියන්න.**

( අභ්‍යන්තර තැනිතලාව, ගෙවත්ත, ලංකාව, තැනිතලාව, මධ්‍යම කඳුකරය, ඩුබායි )

11. ලෝකයේ සේවාවන් හි ප්‍රමුඛයා වනුයේ .......................... රාජ්‍යයයි.
12. අවම භූමි ප්‍රමාණයක වැඩි භූ විෂමතා ලක්ෂණ දැකිය හැකි රටක් ලෙස .......................... හැඳින්විය හැකිය.
13. ජල පෝෂක ප්‍රදේශ, කඳුවැටි ආදී ලක්ෂණ දැකිය හැකිවන්නේ .......................... කලාපයේය.

14. මැද රැළි බිම, ශේෂ කඳු දැකිය හැකි වන්නේ .......................... කලාපයේ ය.

15. මෙට්‍රික් සිතියමක දැක්වෙන සංස්කෘතික ලක්ෂණයක් වනුයේ ..........................යි.

- **අංක 16 - 20 දක්වා A තීරුව හා ගැළපෙන පිළිතුර B තීරුවෙන් තෝරා යා කරන්න.**

| A | B |
|---|---|
| 16. දේශගුණය | ලංකාවේ උෂ්ණත්ව ව්‍යාප්තියේ වෙනස්කම් වලට බලපායි. |
| 17. උන්නතාංශය | ගොඩබිම දෙසට කා වැදුණු මුහුදු ප්‍රදේශයයි. |
| 18. හෝර්ටන් තැන්න | භෞතික භූ දර්ශයේ සංචරකයකි. |
| 19. බොක්ක | කඳුකර වියළි කලාපීය වනාන්තරයකි. |
| 20. තුඩුව | සාගරය දෙසට නෙරාගිය පටු ගොඩබිම් කොටසයි. |

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **අනෙකුත් ප්‍රශ්න අතුරින් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5කි.**




01. I. ඉහත සිතියම් ප්‍රදේශය ඇසුරින් පිළිතුරු සපයන්න.

a) සිතියම් ප්‍රදේශයෙහි **a,b,c** යනුවෙන් දක්වා ඇති මුහුද ආශ්‍රිත භූ ලක්ෂණ හඳුනාගෙන පිළිවෙලින් ලියන්න.

b) සිතියම් ප්‍රදේශයෙහි වෙරළට සමාන්තරව දිවෙන මාර්ගය කුමන ශ්‍රේණියට අයත්ද?

II. 1:50 000 සිතියමක දැකිය හැකි සංස්කෘතික ලක්ෂණ 05ක් ලියන්න.

III. පහත සඳහන් ලක්ෂණ සිතියමක පෙන්වන ආකාරය නියමිත වර්ණ හා සංකේත මඟින් ඇඳ දක්වන්න.

a) දුම්රිය මාර්ගය  b) පළාත් මායිම  c) කොත්කන්ද  d) නෙරුව  e) නිම්නය

02. I. ආසියා මහද්වීමයේ සුවිශේෂී ලක්ෂණ 2ක් ලියන්න.

II. ආසියා මහද්වීපයේ උතුරු, දකුණ, නැගෙනහිර හා බටහිරින් මායිම් වන්නේ කෙසේදැයි ලියන්න.

III. "ලෝකයේ අන් සියලුම මහද්වීප වලට වඩා ආසියාව සුවිශේෂ මහද්වීපයක් වේ." එසේ සුවිශේෂී වීමට හේතු 05ක් ලියා ඉන් 2ක් විස්තර කරන්න.

03. I. ආසියා මහද්වීපයට අයත් දේශගුණ වර්ග ලියා දක්වන්න.

II. ආසියා මහද්වීපයේ නිවර්තන දේශගුණික කලාපය තුළ පැතිරී ඇති අනු දේශගුණික වර්ග මොනවාද?

III. ආසියා මහද්වීපයේ පැතිර පවතින වනාන්තර වර්ග කොට ඒවායෙහි ජීවත් වන සත්ත්ව විශේෂ හා ශාක විශේෂ දෙක බැගින් ලියන්න.

04. I. ආසියා මහද්වීපයේ දැකිය හැකි ඉපැරණි ශිෂ්ටාචාර 2ක් ලියන්න.

II. ආසියාවේ අසම ජන ව්‍යාප්තිය කෙරෙහි බලපා ඇති සාධක 4ක් ලියන්න.

III. පහත මාතෘකා වලින් එකක් තෝරාගෙන කෙටි විස්තරයක් කරන්න.

A) කාර්මීකරනයේ යෝධයා ජපානය

B) සේවා මධ්‍යස්ථානයක් ලෙෂ ඩුබායි

C) ආසියාවේ කෘෂිකාර්මික රටක් ලෙෂ පාකිස්ථානය

05. I. භෞතික භූ දර්ශනයේ සංරචක 2ක් ලියන්න.

II. ලංකාව භූ විෂමතාවය අනුව බෙද දක්වන කලාප 3 මොනවාද?

III. ලංකාවේ වෙරළබඩ තැනිතලාව හඳුන්වා එහි ඇති භූ විෂමතා ලක්ෂණ උදාහරණද සමඟ පෙන්වා දෙන්න.

06. I. කාලගුණය යනු කුමක්දැයි ලියන්න.

II. ශ්‍රී ලංකාවේ උෂ්ණත්වය ව්‍යාප්තිය කෙරෙහි බලපාන සාධක 3ක් නම් කරන්න.

III. ලංකාවට වර්ෂාව ලැබෙන ප්‍රධාන ක්‍රම 3න සඳහන් කර ඉන් එක් ක්‍රමයක් පිළිබඳ විස්තර කරන්න.

07. I. ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රධාන අංශ 3න මොනවාද?

II. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයෙහි වගා කරනු ලබන වැවිලි වගාවන් 5ක් නම් කරන්න.

III. ශ්‍රී ලංකාවේ සිදු කරනු ලබන මානුෂ ක්‍රියාකරකම් භෞතික පරිසරයට අහිතකර අන්දමින් බලපාන ආකාරය කරුණු වශයෙන් ලියා විස්තර කරන්න.